**ශීර්ෂය 306 - දුම්රිය දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3:1:2 වගුවේ ඇතුළත් සංකේතයට අදාළ ආදායම් ගිණුම හා ගබඩා අත්තිකාරම් ගිණුම දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම.

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 306 - දුම්රිය දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 23 දින දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත්

විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබූ බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරීන් එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.3.1 |
| | | 3. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.1 |
| | | 4. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.2.1 |
| | | 5. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.2.2 |
| | | 6. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2 |
| | | 7. අනාර්ථික ගනුදෙනු | 2.8 |
| | | 8. මුදලට අගය විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු | 2.10 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම | 2.2.1 (iii) |
| | | 2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2 |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම | 2.16 |
| | | 2. අනුකූල නොවීම් | 2.17 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.12 |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.13 |
| | | 3. ගබඩා අත්තිකාරම් ගිණුම්වල වූ අඩුපාඩු | 2.14 |
| | | 4. ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාමේ අත්තිකාරම් ගිණුම්වල අඩුපාඩු | 2.15 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු | 2.4 (ඇ) |

| | | | |
|---|---|---|---|
| | සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 2. කළමනාකරණ දුර්වලතා<br>3. වත්කම් කළමනාකරණය | 2.9<br>2.4 (අ),(ආ),(ඇ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම<br>2. වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම | 2.11<br>2.1.3 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | අවිධිමත් ගනුදෙනු | 2.6 |
| 128(1)(ඒ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබව බව | පාඩු හා හානි | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

----------------

#### 2.1.1 සැලැසුම් කිරීම

----------------

සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 14 ක් පැවති අතර දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති උප දෙපාර්තමේන්තු 10 ක් සහ විදේශ ව්‍යාපෘති 09 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. එසේ වුවද දෙපාර්තමේන්තුවේ ආදායම් සංකේතයට අදාල ආදායම එකතු කිරීම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම.

------------------------------

**ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම.**

--------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව උප දෙපාර්තමේන්තු 02 ක් විසින් ඉටු කළ යුතු කාර්යභාරයන් ඉටු කිරීම සඳහා සලසා තිබූ රු. මිලියන 3,060 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

**(ii)** 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් රු.මිලියන 2,509 ක ප්‍රතිපාදන ලබා දී තිබූ ව්‍යාපෘති 07 ක මූල්‍ය කාර්යසාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

#### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 01 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

#### 2.1.4 තිරසාර සංවර්ධන අරමුණු

---------------------------

දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක, එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් හා ඉලක්ක කරා ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි

## 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශ ආධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 34 ක් සඳහා එකතුව රු.මිලියන 9,023 ක ප්‍රතිපාදනයක් , දුම්රිය මාර්ග ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘති 05 ක් හා දුම්රිය ඇණිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 04 ක් වශයෙන් එකතුව විදේශ ආධාර ව්‍යාපෘති 09 ක් සඳහා රු.මිලියන 9,411 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.මිලියන 7,377 ක් හා රු.මිලියන 5,463 ක් වශයෙන් රු.මිලියන 12,840 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 5,594 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 30 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### 2.2.1 විදේශ ආධාර ව්‍යාපෘති

දුම්රිය මාර්ග සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වූ විදේශ ව්‍යාපෘති 05 ක කාර්යයන් අවසන් වී ඇති අතර ඒ සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** උතුරු දුම්රිය මාර්ගය සඳහා සංඥා හා විදුලි සංදේශ පද්ධතිය සවි කිරීමට පෙර දුම්රිය ස්ථාන කුඩා හා විශාල වශයෙන් හඳුනා ගැනීමකින් තොරව සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා දුම්රිය ස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 1,020,127 ක් වැඩිපුර ගෙවා තිබුණි. වැඩිපුර ගෙවා ඇති මුදලින් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 339,927 ක් පමණක් අයකර ගෙන තිබූ අතර 2018 ජූලි අවසන් වන විටත් ඉතිරි මුදල ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 680,200 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

**(ආ)** මඩු සිට තලෙයි මන්නාරම් දක්වා වූ දුම්රිය මාර්ගයේ ඉදිකර තිබූ පාලම් 03 ක් දෝෂ සහිත තත්ත්වයේ පැවති බැවින් එම පාලම් ඉවත් කර නව පාලම් ඉදිකිරීමට කොන්ත්‍රාත් සමාගම එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ ගිවිසුම්ගත කාලය හා දෝෂ නිවැරදි කිරීමේ කාලය 2016 දෙසැම්බර් 13 දින අවසන් වී තිබුණ ද, දෝෂ නිවැරදි කිරීමට හා පාලම් ඉදිකිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

### 2.2.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** එකතුව රු. මිලියන 874 ක් (US $ 6,478) ක් වූ දුම්රිය හරස් මාර්ග ගේට්ටු 200 ක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2016 ඔක්තෝම්බර් 26 දින ප්‍රදානය කර තිබූ අතර 2018 ජනවාරි 26 දිනට නිම කර භාරදිය යුතුව තිබුණද 2018 අගෝස්තු 31 දින වන විට දුම්රිය හරස් මාර්ග ගේට්ටු 84 ක් පමණක් නිම කර තිබුණි. 2017 වර්ෂය තුළදී පමණක් දුම්රිය හරස් මාර්ගවලදී අනතුරු 651 ක් සිදුවී තිබූ අතර ඒ සඳහා මෙම ව්‍යාපෘතියේ ප්‍රමාදයද බලපෑමක් නැතැයි යන්න විගණනයේ දී බැහැර කළ නොහැක.

**(ආ)** දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වලින් අක්කර 2,000 ක් බාහිර පාර්ශවයන්ට බදු දීම්වලට අදාළව ලිපිගොනු 7,245 ක් පමණ නඩත්තු කෙරෙන බවත් එයින් ලිපිගොනු 5,280 ක් පමණ සක්‍රීය තත්ත්වයේ පවතින බවත් ලිපිගොනු 1,965 ක් අක්‍රීයව පවතින බවත් විගණනයේ දී නිරීක්ෂණය විය. ඉහත බදු ලිපිගොනු පරිගණක ගත කොට යාවත්කාලීන කිරීම සහ බදු ආදායම එකතු කර ගැනීම කාර්යක්ෂම කිරීමට මෘදුකාංගයක් සැකසීම සඳහා 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු. 1,399,015 ක් හා රු. 1,948,929 ක් වැය කර තිබුණ ද මේ දක්වාම ඉහත අරමුණු ඉටු කර ගත නොහැකි වී තිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම.

---

### 2.3.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම.

---

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 12,069 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 10,993 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳව නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරීම හා ප්‍රාරම්භක අවධිය.**

---

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඇ) මාර්ගෝපදේශය පරිදි සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා 4.2.2 මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා කාල සටහන් පිළියෙල කර නොතිබුණි.

**(ආ) සැලැසුම් මෙහෙයුම් අධීක්ෂණය සහ යාවත්කාලීන කිරීම.**

---

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 හා 4.4 මාර්ගෝපදේශ හා 2017 ජනවාරි 16 දිනැති අංක 8/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රසම්පාදන කාල සටහන කාර්තු පදනමින් පිළියෙල කර තිබුණ ද, සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 5.3.11 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදනයට අදාළ සියළු ලියකියවිලි සකස් කර ලංසු කැඳවීම් කළ යුතු වුවද 2013 වර්ෂයේදී රු. මිලියන 39.63 කට S-5 පන්තියේ එන්ජින් එකක් සඳහා ජෙනරේටරයක් හා ඩීසල් එන්ජිමක් මිලට ගැනීමේ ප්‍රසම්පාදනයේ ලංසු කැඳවීමේ ලේඛනවල ලංසු සුරක්ෂණයට අදාළ ලියකියවිලි ඇතුළත් කර නොතිබූ බැවින් කොන්ත්‍රාත් වටිනාකම වෙනුවෙන් ලංසු සුරක්ෂණයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** <u>**අහුන්ගල්ල දුම්රිය ස්ථානයේ සංඥා පද්ධතියක් ඉදිකිරීම.**</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 මාර්ගෝපදේශය අනුව මිල ගණන් කැඳවීමට පෙර ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කළ යුතු නමුත්, ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 890,350 කට මිලදීගත් උපකරණවල මිලෙහි සාධාරණ බව සහතික කර ගැනීම සඳහා ව්‍යාපෘති ඒකකය විසින් ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකසා නොතිබුණි.

**(ii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර කාල සටහනකට අනුව ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කළ යුතු වුවත්, එපරිදි ක්‍රියා නොකිරීම නිසා භාණ්ඩ ලැබීමට නියමිත කාලයට වඩා වසර 03 ක් ගත වී තිබුණි. ඒ අනුව බැංකු පොළී වශයෙන් රු. 4,121,840 ක අමතර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩ මිලදී ගැනීමේ දී ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට නොඅඩු යෝග්‍ය මුදල්මය සුරක්ෂණයක් මගින් වගකීම් පිළිබඳ බැඳීම් ආවරණය කළ යුතුය. එසේ වුවද S - 5 පන්තියේ ඩීසල් එන්ජින් එකක් සඳහා ජෙනරේටරයක්, ඩීසල් එන්ජිමක්, Lorry mounted Crane හා ගල් විදින යන්ත්‍රයක් මිලදී ගැනීමේ දී එපරිදි කටයුතු කර නොතිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**--------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

**---------------------------**

ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය හා මුදල් රෙගුලාසි 1647 ප්‍රකාරව වාහන ලැයිස්තු පිළියෙල කර නොතිබූ අතර, 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වත්කම් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි

**(ආ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම.**

**--------------------------------------------------------------------**

දෙපාර්තමේන්තුව සතු අක්කර 14,129 ක භූමි ප්‍රමාණයෙන් දුම්රිය මාර්ග, කාර්යාල ගොඩනැගිලි හා ගබඩා වෙනුවෙන් අක්කර 2,000 ක්, බදු පදනම මත බාහිර පාර්ශවයන්ට බදු දී ඇති අක්කර 2,000 ක් හා බදු පදනමෙන් තොරව වෙනත් රජයේ ආයතනවලට අක්කර 34 ක්ද වශයෙන් අක්කර 4,034 ක් පමණක් භාවිතයට ගෙන තිබුණි. ඉතිරි දුම්රිය රක්ෂිතයට ගැනෙන විශාල ඉඩම් ප්‍රමාණයක් අනවසර පරිහරණයට ලක් වී තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුව සතු ඉඩම් උපරිම කාර්යක්ෂමතාවයකින් පරිහරණය කර නොමැති බව නිරීක්ෂණය විය.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** වටිනාකම රු. 5,086,986 ක් වටිනා විද්‍යුත් පාලන ඒකක 1,000 ක් 2011 වර්ෂයේ සිට භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ii)** දුම්රිය මැදිරි ඒකක 30 ක්, එන්ජින් 18 ක්, බොගී ගැල් 18 ක්, යන්ත්‍ර ඒකක 22 ක් හා මෝටර් වාහනයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

**(iii)** 1994 වර්ෂයේ දී මිලදී ගත් පිරිවැය රු. මිලියන 33 ක්වූ කන්ටේනර් ෆෝල්ක් ලිෆ්ට් යන්ත්‍රය 2011 වර්ෂයේ සිට ක්‍රියාවිරහිතව පවතින බව නිරීක්ෂණය විය.

**(iv)** රත්මලාන උප දෙපාර්තමේන්තු සංකීර්ණයේ දුම්රිය වැගන් 01 ක් 2002 වර්ෂයේ සිට ද, BMT 5374, BMT 5370 සහ BMT 5381 දරන වැගන් ද දීර්ඝ කාලයක සිට ද පුනරුත්ථාපන කටයුතුවලට නොයොදවා අංගනයේ දිරාපත් වෙමින් නිෂ්ක්‍රීයව පැවතිණි.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 අගෝස්තු 31 දින වනවිටත් ශාඛා කාර්යාල 02 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ii)** 2015, 2016 වර්ෂවල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.5 බැඳීම් හා බැරකම්**

---

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැඳීම්වලට එළඹීම.**

---

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. මිලියන 121 ක ප්‍රතිපාදනය, ඉක්මවා රු.මිලියන 4.9 ක බැඳීම් ඇති කර ගෙන තිබුණි.

**2.6 අවිධිමත් ගනුදෙනු**

---

දෙපාර්තමේන්තුව විසින් 2016 ඔක්තෝම්බර් මාසයේ දී රු. මිලියන 107.49 කට (FOB මිල ) මිලදීගත් මෝටර් ට්‍රොලි 03 න් එක් මෝටර් ට්‍රොලියක් 2018 ජූලි 31 වන විට ධාවනයෙන් ඉවත් කර තිබුණි. එබැවින් මෙම ගනුදෙනුව විධිමත් බවින් තොරවිය.

**2.7 පාඩු හා හානි**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** <u>ගබඩා අත්තිකාරම් ගිණුම</u>.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කපා නොහළ පාඩු ශේෂය රු. මිලියන 69.15 ක් විය. මෙම පාඩු රු. මිලියන 13.83 ක් පමණක් කපා හැරීමට ඉල්ලීම් කර තිබූ අතර, එහි වර්තමාන තත්ත්වය පිළිබඳව විගණනයට වාර්තා නොවුණි.

(ii) භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂය ලෙස රු. මිලියන 6,357.6 ක් දක්වා තිබුණි. මෙම ශේෂය තුළ සාමාන්‍ය තොගය රු. මිලියන 5,312 ක්, මාර්ගස්ථ තොග රු. මිලියන 747.9 ක් හා කපා හැරීමට යෝජිත අලාභ රු. මිලියන 13.8 ක් ඇතුළත් වී තිබුණි. තවද මෙම ගෙවිය යුතු ශේෂයේ භෞතික පැවැත්මක් නොමැති රු. මිලියන 61.8 ක වටිනා ඩීසල් තොගයකින් හා වරායේ දී ඇති වූ ගින්නකින් සිදු වූ රු. මිලියන 55.2 ක අලාභයන්ගෙන් සමන්විත විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට වාර්තා වී ඇති අලාභ හානි අයිතම 626 ක වටිනාකම රු. මිලියන 311 කි. ඉන් වර්ෂ 10 ක් ඉක්ම වූ ශේෂය රු. මිලියන 259.82 ක, වර්ෂ 05 ත් වර්ෂ 10 ත් අතර ශේෂය රු. මිලියන 24.22 ක් හා වර්ෂ 05 ට අඩු ශේෂය රු. මිලියන 27.03 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී නාරාහේන්පිට දුම්රිය ස්ථානය අසල සංඥා ක්‍රියා විරහිත වී තිබිය දී දුම්රිය ධාවනය වීම නිසා සංඥා උපකරණයට (පයින්ටුවට) සිදු වූ හානිය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු. 791,962 ක් වැය කර තිබුණි.

## 2.8 අනාර්ථික ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ දී ලැබී තිබූ රු. මිලියන 39.19 ක් වටිනා S-5 දුම්රියට එන්ජිම සවි කිරීම මාස 02 කින් නිම කර තිබුණ ද, දුම්රිය මැදිරි සවි කිරීම සඳහා නිසි සැලැසුමක් නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 වන විටත් ධාවනයට සුදුසු තත්ත්වයට පත් කර ගත නොහැකි වී තිබුණි. මෙම දුම්රිය එන්ජිම සඳහා වූ වසර 02 ක වගකීම් කාල සීමාව 2016 පෙබරවාරි අවසන් වී ඇති බැවින් එන්ජිමේ දෝෂ සම්බන්ධයෙන් සැපයුම්කරු වගකීමෙන් නිදහස් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2016 ඔක්තෝම්බර් මාසයේ දී මිලදී ගත් මෝටර් ට්‍රොලි 03 ධාවනය ආරම්භ කළ දින සිට මාස 03 ක් ඇතුළත අළුත්වැඩියා කිරීම වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයන්ට අතිකාල ලෙස රු. මිලියන 2.94 ක් ගෙවා තිබුණි. එම වියදම සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු බව ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු විසින් ගබඩා අධිකාරී වෙත දන්වා තිබුණ ද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මෝටර් ට්‍රොලි මිලදී ගැනීමේ දී සැපයුම්කරු භාණ්ඩ නැව්ගත කිරීම 2014 ඔක්තෝම්බර් 29 දින කළ යුතු වුවද නැව්ගත කර තිබුණේ 2016 ඔක්තෝම්බර් 04 දිනදීය. එම හේතුවෙන් දින 230 ක් ප්‍රමාද වී නැව්ගත කිරීම නිසා විනිමය අනුපාතයේ ඇති වූ වර්ධනය හේතුවෙන් සැපයුම්කරුට රු. 2,261,085 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) රත්මලාන උප දෙපාර්තමේන්තුවේ පිහිටි නිල නිවාස 688 කින් 126 ක් සඳහා පමණක් ජල මීටර් සපයා ඇතත්, නිල නිවාස 562 සඳහා මේ වන විටත් ජල මීටර් සපයා නොතිබුණි. එබැවින් උප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජල සැපයුමෙන්ම පදිංචිකරුවන් හා අනවසර පදිංචිකරුවන්ද ජලය ලබා ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 43.68 ක් ගාස්තු වශයෙන් ගෙවා තිබුණි.

**2.9 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** ගැල් හා බහාලුම් පුනරුත්ථාපන ව්‍යාපෘති පරීක්ෂාවේ දී BMT 10601 යන එකම අංකයෙන් වැගන් 02 ක් නම් කර තිබූ අතර, පුනරුත්ථාපන කටයුතුවලට යොදාගෙන තිබූ වැගනය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

**(ආ)** ස්ථානීය පරීක්ෂාවේ මාර්ග පරීක්ෂක කාර්යාලයේ සිතියම් අනුව පේරාදෙණිය නුවර දුම්රිය මාර්ගයේ මුල්ගම්පල ගේට්ටුව අසල සැතපුම් 2 යි දම්වැල් 48 දරන දුම්රිය රක්ෂිතයේ අනවසරයෙන් සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිවෙමින් තිබූ අතර මහල් 03 ක වැඩ අවසන් කර තිබුණි. මෙම අනවසර ඉදිකිරීම නැවත්වීමට දෙපාර්තමේන්තුවේ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

**2.10 මුදලට අගය විගණනය.**

------------------------

දෙපාර්තමේන්තුවට අදාළ සිදු කරන ලද මුදලට අගය පිළිබඳ විගණනයේදී පහත කරුණු අනාවරණය කෙරේ.

**(අ)** <u>කන්ටේනර් ප්‍රවාහනය</u>.

**(i)** දුම්රිය එන්ජිමක් මගින් අඩි 20 ක් දිග කන්ටේනර් 18 ක් ප්‍රවාහනය කළ හැකි අතර අඩි 40 ක් දිග කන්ටේනර් 09 ක් ප්‍රවාහනය කළ හැකිය. මේ සඳහා දුම්රිය එන්ජිම කිලෝමීටර් 01 ක දුරක් ධාවනය කිරීමට ඉන්ධන ලීටරයක් දහනය වේ. දිග අඩි 20 කන්ටේනර් 18 ක් ප්‍රවාහනය සඳහා ප්‍රයිම්මුවර් (බහාලුම් ප්‍රවාහක) 18 ක් භාවිතා කරන්නේ නම් ඒ සඳහා කිලෝමීටරයකට වැය වන ඉන්ධන ප්‍රමාණය (0.26×18) ලීටර් 4.68 ක් වේ. අඩි 40 කන්ටේනර් 09 ක් ප්‍රවාහනය සඳහා ප්‍රයිම්මුවර් (බහාලුම් ප්‍රවාහක) 09 ක් භාවිතා කළ යුතු අතර ඒ සඳහා කිලෝමීටරයකට (0.37×9) ඉන්ධන ලීටර් 3.33 ක් දහනය වේ. මේ අනුව එක් කිලෝමීටරයක් ධාවනය කිරීමට ප්‍රයිම්මුවර් (බහාලුම් ප්‍රවාහක) භාවිතා කරන්නේ නම් අමතරව දහනය වන ඉන්ධනවල සාමාන්‍ය ලීටර් 03 ක් වීම හේතුවෙන් පරිසරයට මුදා හරින වායු හා කාබනික ද්‍රව්‍ය සාමාන්‍ය ප්‍රමාණයට වඩා තුන් ගුණයක් බව නිරීක්ෂණය විය. මේ අනුව දුම්රිය එන්ජින් මගින් කන්ටේනර් ප්‍රවාහනය කිරීමෙන් පරිසරයට සිදුවන හානිය තුන්ගුණයකින් අවම කර ගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වාර්ෂිකව කන්ටේනර් 232,000 ක් පමණ මුදා හරින අතර එම කන්ටේනර් ප්‍රයිම්මුවර් (බහාලුම් ප්‍රවාහක) මගින් ප්‍රවාහනය කිරීම නිසා දහනය කරන අමතර ඉන්ධන ප්‍රමාණය ලීටර් 696,000 ක් වශයෙන් ඇස්තමේන්තු කළ හැකිය.

**(ii)** ශ්‍රී ලංකාවේ වායු දූෂණයෙන් සියයට 12.5 (2001 වර්ෂය) වාහනවලින් පිටකරන දූම් මගින් සිදුවන අතර වර්තමානයේ එය සියයට 40 සීමාව දක්වා ළඟා වී ඇති බව සමීක්ෂණවලින් හෙළි වී තිබේ. දුම්රිය මගින් කන්ටේනර් ප්‍රවාහනය සිදු කරන්නේ නම් වාර්ෂිකව ඉන්ධන ලීටර 696,000 ක දහන වායු හා කාබනික ද්‍රව්‍ය මගින් පරිසරයට මුදා හරින කාබන්මොනොක්සයිඩ් (CO), සල්ෆර් ඔක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ් ($NO_2$), අවලම්භිත අංශුමය පදාර්ථ (SPM) හා බැර ලෝහ හා ඊයම් (Heavy Metals, Pb) යම් ප්‍රමාණයකට පාලනය කිරීමේ හැකියාව ඇති බව නිරීක්ෂණය විය.

**(iii)** ඉහතින් සඳහන් වායු හා බැර ලෝහ ආශ්‍රහණය මගින් ඇතිවන රෝග වන හිස කැරකැවිල්ල, හිසරදය, ස්වශන ආබාධ, සෙම පටල ඇවිස්සීම, නිව්මෝනියාව, ක්ලෝමප්‍රදාහය හා ඇස්මා වැනි රෝගවලින් නිරෝගී ජන ජීවිතයට වන හානිය අවම

කිරීමේ හැකියාව ඇති බැවින් ඒ ගැන අවධානය යොමුකර ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**(ආ)** වාර්ෂිකව ශ්‍රී ලංකා වරායෙන් කන්ටේනර් 232,000 ක් පිටවන අතර අවම වශයෙන් එම කන්ටේනර් ශ්‍රී ලංකා වරායේ සිට ඔරුගොඩවත්ත කන්ටේනර් පර්යන්තය දක්වා කිලෝමීටර් 3.3 ක දුර ප්‍රමාණය දුම්රිය මගින් ප්‍රවාහනය කළ හැකිව තිබුණි. එක් කන්ටේනරයක් කිලෝ මීටරයකට රු. 150 ක ගාස්තුවක් මත දුම්රිය මගින් ප්‍රවාහනය කිරීමට කටයුතු කිරීමෙන් වාර්ෂිකව රු. මිලියන 114.84 ක ආදායමක් උපයා ගත හැකිව තිබුණි. දැනට මෙම ප්‍රවාහන මාධ්‍ය කන්ටේනර් ප්‍රවාහනයට යොදා නොගන්නා බැවින් එම අතිරේක ආදායම උපයා ගැනීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර නොතිබුණි.

**(ඇ)** 1867 සිට 1934 දක්වා වූ කාලය තුළ භාණ්ඩ ප්‍රවාහන ආදායම සමස්ත ආදායමෙන් සියයට 57 ක් වූ අතර වර්තමානයේ එය සියයට 9.3 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව ප්‍රවාහන ආදායම පහළයාමේ ප්‍රතිශතය සියයට 47.7 ක් විය.

**(ඈ)** ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ප්‍රාදේශීය ගබඩා 11 ක 2017 ජනවාරි හා දෙසැම්බර් මාසවල හැර අනෙකුත් මාසවල ඉන්ධන අවශ්‍යතාවය ලීටර් 987,402,120 ක් වී තිබුණි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉන්ධන ලීටර් 315,435,760 ක් දුම්රිය මගින් ප්‍රවාහනය කර තිබුණි. ඒ අනුව එම ප්‍රාදේශීය ගබඩා වෙත තවත් ඉන්ධන ලීටර් 671,966,360 ක් දුම්රිය මගින් ප්‍රවාහනය කළ හැකිව තිබුණත්, එම ඉන්ධන ප්‍රමාණය දුම්රිය මගින් ප්‍රවාහනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. ප්‍රවාහනය කළ එම ඉන්ධන තොගය ඩීසල් (BGT) නම් රු. මිලියන 449.39 ක ආදායමක් හෝ පෙට්‍රල් (BMT) නම් රු. මිලියන 360.43 ක ආදායමක් ලබා ගැනීමට හැකියාව තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඉ)** දුම්රිය මගින් සිමෙන්ති ප්‍රවාහනය කර උපයා තිබුණු ආදායම 2013 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ දී රු. මිලියන 13.22 කින් හෙවත් සියයට 60 ක පමණ ප්‍රමාණයකින් අඩු වී තිබුණි. එම ආදායම වැඩි කර ගැනීම පිළිබඳ උපාය මාර්ග කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.11 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම.**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| 2017 | මූලධන | 18,487 | 12,889 | 5,598 | 30.28 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | 14,571 | 14,080 | 490 | 3.36 |
| | එකතුව | **33,058** | **26,969** | **6,088** | **18.41** |
| 2016 | මූලධන | 21,337 | 15,694 | 5,644 | 26.45 |
| | පුනරාවර්තන | 14,288 | 13,396 | 732 | 5.18 |
| | එකතුව | **35,676** | **29,090** | **6,376** | **17.87** |
| 2015 | මූලධන | 43,886 | 30,436 | 13,450 | 30.64 |
| | පුනරාවර්තන | 14,165 | 14,049 | 116 | 0.81 |
| | එකතුව | **58,051** | **44,485** | **13,566** | **23.36** |
| 2014 | මූලධන | 36,728 | 36,436 | 292 | 0.79 |
| | පුනරාවර්තන | 16,964 | 16,943 | 21 | 0.12 |
| | එකතුව | **53,692** | **53,379** | **313** | **0.58** |
| 2013 | මූලධන | 21,751 | 20,393 | 1,358 | 6.24 |
| | පුනරාවර්තන | 10,791 | 10,586 | 205 | 1.09 |
| | එකතුව | **32,542** | **30,979** | **1,563** | **4.80** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විසර්ජන ගිණුම**
**----------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** **සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම.**

වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 3,063.2 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ආ)** **අධි ප්‍රතිපාදන සලසා තිබීම.**

වැය විෂයයන් 48 ක ඉතිරිවීම් රු. මිලියන 829.53 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 ක සිට සියයට 50 ක් දක්වා විය. වැය විෂයයන් 08 ක ඉතිරිවීම් රු. මිලියන 1,893.6 ක් වූ අතර එය සියයට 51 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක පැවතුණි.

## 2.12 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

---

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 01 ක් සඳහා එකතුව රු.මිලියන 7,200 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 6,489.9 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 91 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2017 දෙසැම්බර් 31දිනට | | | රැස්කළ ආදායම ඇස්තමේන්තු කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| 20:01:01:00 | 7,200 | 6,489.9 | (710) | 90.13 |

**20:01:01:00** දරන ආදායම් සංකේතය - දුම්රිය දෙපාර්තමේන්තුව

---

විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,525.27 ක් ආදායම් හිඟහිට තිබුණු අතර, හිඟහිටි කාල පරාසය වර්ෂ 01 ක සිට 55 ක් දක්වා විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2017 දෙසැම්බර් 31 දිනට හිඟ බලපත්‍ර ආදායම් රු. මිලියන 1,387.29 ක් වන අතර බලපත්‍ර 2 හි ආදායමේ අයවිය යුතු මුළු මුදලින් සියයට 31 ක් වර්ෂ 05 ක් ඉක්ම වූ හිඟ ණය ශේෂ විය. 2018 ජූනි 30 දින වන විට මෙම හිඟ ආදායම් වලින් රු. මිලියන 360.62 ක් නිරවුල් කර ගැනීමට හැකි වූ බව දන්වා තිබුණි. තවද බලපත්‍ර 01 හි ආදායමේ වර්ෂ 20 කට වඩා පැරණි රු. මිලියන 0.77 ක හිඟ ශේෂය මේ දක්වාම නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ආ)** දුම්රිය භාණ්ඩ ප්‍රවාහනය වෙනුවෙන් අයවිය යුතු ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 34 කින් රු. මිලියන 71.74 ක මුදලක් අය විය යුතුව පැවති අතර ඉන් ආයතන 17 කින් ලැබිය යුතු රු. මිලියන 20.3 ක හිඟ ශේෂය වර්ෂ 17 කට වඩා පැරණි ශේෂ විය. 2018 අගෝස්තු 30 වන විට මෙම හිඟ මුදලින් රු. මිලියන 33.55 ක් අයකර ගෙන ඇති බව දන්වා තිබුණි.

**(ඇ)** සියැම්සිටි සිමෙන්ට් (ලංකා) සමාගමට හුණුගල් ප්‍රවාහනය සඳහා සේවා සැපයීම වෙනුවෙන් අයවිය යුතු වර්ෂ 05 ක් ඉක්මවන රු. මිලියන 18.21 ක ශේෂ අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 2.13 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 830 | 820 | 400 | 453 | 1,500 | 1,320 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම.**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 92,315,632 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 03 ක සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**(ii)** 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 23 ක් වූ දේපල ණය හිඟ ශේෂයෙන් දේපල ණය ලබාගත් 39 දෙනෙකුගෙන් රු. මිලියන 10.5 ක මුදලක් අයකර ගත නොහැකිව පවතින අතර ඔප්පුවේ මුල් පිටපත හා අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලය ප්‍රයෝජනයට ගෙන හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) පැහැදිලි නොකළ වෙනස්කම්.**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** 2017 වර්ෂය ආරම්භයේදී දෙපාර්තමේන්තු පොත් අනුව පාලන ගිණුමේ ආරම්භක ශේෂය රු. මිලියන 949.82 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ශේෂය රු. මිලියන 954 ක් විය. මේ අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු. මිලියන 4.18 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස 2004 වර්ෂයේ සිට පැවත එන අතර එය නිරවුල් කිරීමට විගණිත දින දක්වාම කටයුතු කර නොතිබුණි.

**(ii)** 2004 ඔක්තෝම්බර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6.3 වගන්තිය පරිදි කේවල ණය ශේෂ වර්ගීකරණයේ එකතුව දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය සමඟ සැසඳිය යුතු වුවද එපරිදි කටයුතු නොකිරීම නිසා ඉහත ශේෂ දෙක අතර රු. මිලියන 21.74 ක වෙනසක් පැවතුණි.

## 2.14 ගබඩා අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30602 යටතේ ගබඩා අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2,000 | 1,576 | 1,800 | 1,698 | 8,535 | 6,357 | 1,500 | - |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඇති සියළුම ද්‍රව්‍ය භෞතික තොග සමීක්ෂණයකින් පසුව පිරිවැයට අගය කළ යුතුය. සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණය කිරීමකින් තොරව

තොග පොත්වල දැක්වෙන ශේෂය පදනම් කරගෙන අවසන් තොගයේ වටිනාකම රු. 5,312,065,598 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) 2013 වර්ෂයට පෙර මිලදී ගන්නා ලද තොග කාණ්ඩවලට අදාලව පෙර වර්ෂ අධි තක්සේරුවීම් ලෙස දක්වා තිබූ රු. මිලියන 398.33 ක ශේෂය විගණිත දිනය දක්වා නිරවුල් කර ගැනීමට නොහැකි වී ඇති අතර, එම හේතුවෙන් භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදල මෙම අධි තක්සේරුව නිසා අඩු වී තිබුණි.

(ඇ) වර්ෂ ගණනාවකට පෙර සිට පැවත එන ගබඩා අත්තිකාරම් ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීමේ දී ආරම්භක ශේෂයේ හා අවසාන ශේෂයේ රු. 25,025,164 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට ගබඩා ලෙජරය අනුව උප දෙපාර්තමේන්තු 17 ක් යටතේ නිකුත් කළ තොග සඳහා ලැබිය යුතු ගබඩා බිල්පත් වටිනාකම රු. 805,263,496 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණ ද මෙම ශේෂය උප දෙපාර්තමේන්තු පොත් සමඟ සැසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 1993 වර්ෂයේ සිට මේ දක්වා භාණ්ඩ ආනයනයේ දී රේගු ගාස්තු වශයෙන් දරන ලද රු. 108,468,192 ක වියදම 2017 දෙසැම්බර් 31 දිනට වූ තොගයට ගැලපීම සඳහා කටයුතු කර නොතිබුණි. මෙම මුදලින් 2018 ජූනි 30 දින වන විට රු. 34,541,470 ක් නිරවුල් කර ඇති බව දන්වා තිබුණි.

(ඊ) භාණ්ඩ මිලදී ගැනීම සඳහා 1980 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා වර්ෂ 37 ක කාල පරිච්ඡේදය තුළ සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම්වලින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු අත්තිකාරම් ශේෂය රු. මිලියන 18.37 ක් විය. 2018 වර්ෂයේ දී රු. මිලියන 7.82 ක් නිරවුල් කර තිබුණි.

(උ) 2017 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන්ට බැංකු ණයවර ලිපි සඳහා රු. 76,540,868 ක් ගෙවා තිබූ නමුත් භාණ්ඩ සපයා නොතිබූ බැවින් සැපයුම්කරුවන් දැනුවත් කර භාණ්ඩ ගෙන්වා ගැනීමට හෝ වෙනත් සුදුසු පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 1980 - 2009 දක්වා කාලයට අදාළව සැපයුම්කරුවන්ට ණයවර ලිපි සඳහා ගෙවා තිබූ රු. 33,681,582 සඳහා මුදල් ආපසු අයවීමක් හෝ භාණ්ඩ ලැබීමක් සිදු වී නොතිබුණි.

(ඌ) 1998 සිට 2017 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු. මිලියන 533 ක් වූ අතර 2018 ජූනි 30 වන විට රු. මිලියන 165ක් වූ ණයවර ලිපි නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

(එ) ගබඩා අත්තිකාරම් ගිණුමේ විවිධ ණය හිමියන් ලෙස දක්වා ඇති රු. මිලියන 123 ක් වූ ශේෂය තුල හඳුනාගත නොහැකි වර්ෂ 07 ක සිට වර්ෂ 20 ක් දක්වා පරාසයක පැරණි රු. මිලියන 77 ක ශේෂයක් පැවතිණි.

**2.15 ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම.**

අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව අත්තිකාරම් ගිණුම් කාර්යයන් 05ක ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු අතර, එම ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු 1987 වන විට අවසන් කළ යුතුව තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 30 ක් ගතවී තිබුණත්, එම ඇවර කිරීමේ කටයුතු නිම කර නොතිබුණි. තවද එම ගිණුම්වල අනුමත නොකළ සමුච්චිත කාරක පාඩු එකතුව රු.මිලියන 3.4 ක් විය.

**2.16 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| **(අ)** | උප දෙපාර්තමේන්තු ඒකාබද්ධ කර පොදු ස්ථාවර වත්කම් ලේඛනය. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය |
| **(ආ)** | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| **(ඇ)** | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

**2.17 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| **(අ)** | <u>**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**</u> | | |
| **(i)** | මුදල් රෙගුලාසි 103, 104,105 සහ 109 | 298,976,755 | අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අප්‍රමාදව කටයුතු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ අලාභහානි සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| **(ii)** | මුදල් රෙගුලාසි 128 (1) | 3,568,752 | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම හා කාර්යක්ෂමව කටයුතු නොකිරීම හේතුවෙන් |

| | | | |
|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂයේදී ගබඩා ද්‍රව්‍ය වරායෙන් නිෂ්කාශනය කර ගැනීම ප්‍රමාදවීම නිසා ප්‍රමාද ගාස්තු (Demmarages) ගෙවීමට සිදු වී තිබුණි. |
| **(iii)** | මුදල් රෙගුලාසි 565 (5) | 526,270,263 | මාසික තැන්පත් සාරාංශ ප්‍රකාශය ඊළග මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** | 2010 පෙබරවාරි 03 දිනැති අංක SP/RD/2/10 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ 6 ඡේදය. | - | දුම්රිය රක්ෂිතයේ පදිංචි අනවසරකරුවන් ඉවත් කිරීම සඳහා 1979 අංක 07 දරන රජයේ ඉඩම් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | 2013 ජනවාරි 24 දිනැති අංක SA/AS/AA/Circular දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය. | | චක්‍රලේඛය ප්‍රකාර සමාලෝචිත වර්ෂය සඳහා වූ ආදායම් ගිණුම් උපචිත පදනම යටතේ පිළියෙල කර නොතිබුණි. |

**2.18 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 9,096 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 568,360 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 212 | 117 | 95 | - |
| (ii) | තෘතියික මට්ටම | 451 | 123 | 328 | - |
| (iii) | ද්විතියික මට්ටම | 10,958 | 6,667 | 4,291 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 8,601 | 7,900 | 701 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | - | 1,204 | - | 1,204 |
| | එකතුව | 20,222 | 16,011 | 5,415 | 1,204 |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) **කාර්ය මණ්ඩල අඩුපාඩු**

(i) දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල දත්ත අනුව 2017 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව එහි අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 45 ක් විය. ආයතනයේ දැක්ම හා මෙහෙවර ළගා කර ගැනීම සඳහා උපකාරී වන ප්‍රධාන නියමුවන්ගේ තනතුරුවල ඌනතාවය ඉකුත් වර්ෂවලට වඩා සමාලෝචිත වර්ෂය තුළදී වැඩිවීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය අඩුවීම කෙරෙහි ඍජුවම බලපානු ඇතැයි යන සැකය විගණනයේ දී බැහැර කළ නොහැක.

(ii) දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ බඳවා ගැනීමේ පරිපාටියක් නොතිබුණි.

(iii) අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), ගමනාගමන අධිකාරී හා සහකාර ගබඩා අධිකාරී ආදී තනතුරු 09 ක් වැඩ ආවරණය කිරීමට නිලධාරීන් පත්කර තිබුණි.

(iv) දෙපාර්තමේන්තුව විසින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර සේවකයින් 1,204 ක් අනියම් කාර්ය මණ්ඩලය ලෙස විධිමත් අනුමැතියකින් තොරව බඳවා ගෙන තිබුණි.

(v) රත්මලාන උප දෙපාර්තමේන්තුවේ ආරක්ෂක කටයුතු සඳහා අනුමත ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව 75 ක් වන අතර සේවයේ යොදවා සිටි සංඛ්‍යාව 41 ක් විය. විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පැවතීම ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල තර්ජනයක් වී ඇති බව විගණනයේ දී පෙන්වා දෙනු කැමත්තෙමි.

(vi) දෙපාර්තමේන්තුවේ පවතින ෂන්ටින් රියදුරු, එන්ජින් රියදුරු, රියදුරු සහායක, දුම්රිය නියාමක, දුම්රිය ස්ථානාධිපති හා දුම්රිය අධීක්ෂණ කළමනාකරණ යන සේවකයන්ගේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර දෙපාර්තමේන්තු සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 144 ක් නැවත සේවයේ යොදවා ගෙන තිබුණි.

(ආ) **අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙත නිලධාරීන් 32 ක් අවිධිමත් ලෙස මුදාහැර තිබුණි.